# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## රාජ්‍ය නැටුම් කණ්ඩායමේ නැටුම් ශිල්පී තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

01. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නැටුම් කණ්ඩායමේ පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් 2024.02.07 දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි :

   i. පත්වීම වසර 03ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පමණක් වන අතර, ස්ථිර පත්වීමක් ලබාගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

   ii. වැටුප රු.33,600/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

04. වයස් සීමාව :

   අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 25 ට නොවැඩි විය යුතු ය.

05. බඳවා ගැනීමේ සුදුසුකම් හා ආදර්ශ අයදුම්පත දෙපාර්තමේන්තු වෙබ් අඩවිය **www.culturaldept.gov.lk** තුළින් බාගත කර ගැනීමට හැකිය.

06. නියමිත සුදුසුකම් සපුරන අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,**
**08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**
**2024.01.07**